

ජේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

புடவைக் கைத்தொழில் திணைக்களம்

DEPARTMENT OF TEXTILE INDUSTRY

3 වන මහල, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, මාලිගාවත්ත, කොළඹ 10

3ஆம் மாடி,செயலகக் கட்டிடம், மாளிகாவத்தை, கொழும்பு 10

3rd Floor, Secretariat Building, Maligawatta, Colombo 10

අන්තර්ගතය

පරිච්ඡේදය 01: ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03: වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04: කාර්ය සාධන දර්ශකය

පරිච්ඡේදය 05: තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06: මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07: අනුකූලතා වාර්තාව

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය 01 : ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම ඇතුළුව සියලුම අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත කටයුතු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම හා ඊට අදාළව පේෂ කර්මාන්ත පුහුණු ආයතන සහ මෝස්තර මධ්‍යස්ථාන මඟින් අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය දැනුම හා නිපුණත්වයෙන් යුතු මානව සම්පත බිහි කිරීම සහ සංවර්ධනය කිරීම පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජය ගත හැකි පරිදි අත්යන්ත්‍ර පේෂකර්ම ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරඟකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම.

මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම, අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.

අරමුණු

- අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම
- නිෂ්පාදනය සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සම්පාදනය කිරීම
  - ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
  - මෝස්තර සම්පාදන වැඩසටහන්
  - පුහුණුකරවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශකයින් හා කාර්යමණ්ඩල පුහුණු කිරීම
- ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම
- අලෙවි ප්‍රවර්ධනය (දේශීය හා විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම)
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයං රැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ මෝස්තර සංවර්ධන හා ගුණාත්මක වර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන හා තරඟ පැවැත්වීම
- ජාතික අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ අත්හදාබැලීම් හා සංරක්ෂණ කටයුතු
- නව තාක්ෂණය හඳුන්වාදීම හා අදාළ සංවර්ධන කටයුතු

1.3 ප්‍රධාන කාර්යයන්

1.3.1.පේෂ කර්මාන්ත පුහුණු ව්‍යාපෘති

- **පේෂ කර්මාන්ත පුහුණු පාසැල් වලට සිසුන් බඳවාගෙන පුහුණු කිරීම**

  පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂ කර්මාන්ත පුහුණු ආයතන 14 ක් මඟින් පවත්වන පේෂ කර්මාන්තය පිළිබඳ සය මාසික මූලික පුහුණු පාඨමාලාව හා මාස 13ක අවසාන සහතිකපත්‍ර පාඨමාලාව තුළින් අදාළ පුහුණුව ලබා දෙයි.

  ඒ අනුව 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 150 දෙනෙකු බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. සුදුසුකම්ලත් සිසුන් සඳහා 2022 මාර්තු 30 වන දින මෙම පාඨමාලාව ආරම්භ කරන ලදී.

- **ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි තරඟය, ප්‍රදර්ශනය හා සම්මාන උළෙල**

  අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල අරමුණු කොට දේශීය රෙදිපිළි නිර්මාණය කරන අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන් ගේ හැකියාවන් ඔප් නැංවීම, දිරි ගැන්වීම හා ඔවුන්ගේ කුසලතා අගය කිරීම සඳහා වාර්ෂිකව පවත්වන ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි තරඟයේ අවසන් විනිශ්චය කටයුතු 2022 ඔක්තෝබර් මස 27 දින කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතනයේ දී පැවැත්වීමට කටයුතු කරන ලදී. එම තරඟයට අදාළව සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2022 දෙසැම්බර් මස 02 වෙනි දින කටුබැද්ද පර්යේෂණ, පුහුණු සේවා හා මෝස්තර අංශයේ ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ අතර අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ජාතික ප්‍රදර්ශනය හා අලෙවි සල්පිල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ සිරිමාවෝ බණ්ඩාරනායක පරිශ්‍රයේ දී පවත්වන ලදී.

1.3.2.විභාග පැවැත්වීම

- **පේෂ කර්මාන්ත පුහුණු පාඨමාලා සම්බන්ධ විභාග කටයුතු**

  පේෂ කර්මාන්ත අවසාන සහතිකපත්‍ර හා මූලික පුහුණු පාඨමාලාවන්ට අදාළ විභාග කටයුතු 2022 මාර්තු මස 21-23 යන දිනයන්හි පවත්වන ලදි. මේ සඳහා පේෂ කර්මාන්ත පුහුණු ආයතනවල සිසුන් 145 දෙනෙකු හා බාහිර අයදුම්කරුවන් 62 දෙනෙකු පෙනී සිටින ලදි.

විභාග මධ්‍යස්ථානය	පේෂ කර්මාන්ත පුහුණු ආයතන සිසුන් සංඛ්‍යාව	බාහිර අයදුම්කරුවන් සංඛ්‍යාව
කොට්ටල	**11**	**-**
කටුබැද්ද	**05**	**01**
ගැටඹේ	**14**	**03**
කිරම	**08**	**03**
බෝයගනේ	**19**	**01**
මාතලේ	**15**	**05**
බණ්ඩාරවෙල	**14**	**09**
මාතර	**-**	**-**
වටපුළුව	**20**	**03**
පින්නවල	**13**	**02**
තලාව	**08**	**01**
ගාල්ල	**04**	**01**
සමන්තුරේ	**11**	**24**
නල්ලූර්	**03**	**09**
එකතුව	**145**	**62**

මෝස්තර පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා 2021 අප්‍රේල් මස 19 වන දින බඳවා ගන්නා ලද සිසුන් සඳහා පාඨමාලාව අවසානයේ පවත්වන පරීක්ෂණය 2022 ජූලි මස 25,26 හා 27 යන දිනවල පැවැත්වීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරන ලදි. ඒ සඳහා ගැටඹේ මෝස්තර පුහුණු ආයතනයේ සිසුන් 11 දෙනෙකු හා කටුබැද්ද මෝස්තර පුහුණු ආයතනයේ සිසුන් 14 දෙනෙකු වශයෙන් සිසු සිසුවියන් 25 දෙනෙකු පෙනී සිට ඇත.

1.3.3 සේවාස්ථ පුහුණු වැඩසටහන

පේෂ කර්මාන්තකරුවන්, ව්‍යවසායකයින් හා උපදේශකයින් දක්වා විහිදී යන පරිදි පේෂ කර්මාන්තයේ වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ.

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, පළාත් රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික අංශයේ අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ කර්මාන්ත ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් 2022 වර්ෂයේදී පුහුණුලාභීන් 195 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 08 ක් පවත්වන ලදි.

2022 වර්ෂයේ පැවැත්වූ පාඨමාලා විස්තරය

අනු අංකය	පාඨමාලාවේ නම	පැවැත්වූ දිනය	සහභාගීවූ සංඛ්‍යාව	පැවැත්වූ ස්ථානය
1	දික්ජාලා මොස්තර පුහුණුව	2022-01-19 සිට 24 දක්වා	26	කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතනය
2	දුම්බර රටා මෝස්තර පුහුණුව	2022-03-14 සිට 16 දක්වා	18	කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතනය
3	පේෂ කර්මාන්ත උපදේශක නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය	2022-03-28	49	ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය
4	වර්ණ සංයෝජනය පිළිබඳ පුහුණුව	2022-03-29 සිට 31 දක්වා	35	කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතනය
5	නූල් සුදුකිරීම සහ වර්ණ ගැන්වීම පිළිබඳ පුහුණුව	2022-05-23 සිට 25 දක්වා	20	කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතනය
6	ලොනෝවියමන් මෝස්තර පුහුණුව	2022-10-03 සිට 06 දක්වා	20	කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතනය
7	ස්වාභාවික වර්ණ ආශ්‍රිත නූල් වර්ණ ගැන්වීමේ පුහුණුව	2022-10-18 සිට 20 දක්වා	22	කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතනය
8	වූල්තුවා නිර්මාණය පිළිබඳ පුහුණුව	2022-12-05 සිට 10 දක්වා	05	වවුනියා - තොනික්කල්

1.3.4. අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීම

වඩාත් ඵලදායී ජීවනෝපාය මාර්ගයක් ලෙස අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය ග්‍රාමීය මට්ටමෙන් ව්‍යාප්ත කරලීමේ අරමුණෙන් බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ විවිධ දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීමට මූලික කටයුතු කර ඇත.

අදාළ ප්‍රදේශවල තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳ මාස හයක පුහුණුව ලබා දීමෙන් පසු කර්මාන්තය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අත්යන්ත්‍ර, මූලික උපකරණ හා අමුද්‍රව්‍ය නොමිලේ ලබා දීමෙන් අනතුරුව පුහුණුව ලද ප්‍රතිලාභීන් කර්මාන්තගත කිරීමට කටයුතු කරන අතර කර්මාන්තයේ නිරත දේශීය නිෂ්පාදකයන් දිරි ගැන්වීමේ අරමුණෙන් ඔවුන් සඳහා අවශ්‍ය අත්යන්ත්‍ර උපකරණ නොමිලේ බෙදා දීම සිදු කරනු ලැබේ.

ඒ අනුව 2021 වර්ෂයේ දී හඳුනාගත් ව්‍යාපෘති යෝජනාවලින් 2022 වර්ෂයේදී ආරම්භ කළ ව්‍යාපෘති විස්තර පහතින් දැක්වේ.

අනු අංකය	**ව්‍යාපෘතියේ නම**	**පුහුණුලාභීන් ගණන**
1	කනව අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	16
2	බුත්පිටිය අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	09
3	කොබෙයිගනේ අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	5
4	නිළිඅතුගොඩ අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	5
5	හිගුරලකන්ද අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	04
6	කුඹුක්කන අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	07
7	මිනුවන්ගැටේ අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	05
8	පොල්පිතිගම අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	09
9	වැහිගල අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	06
10	මාතලේ අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	05
මුළු ප්‍රතිලාභී ගණන		71


ඒ අනුව 2023 වර්ෂයේ ආරම්භ කිරීමට නියමිත අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ව්‍යාපෘති නාමලේඛනය

අනු අංකය	ව්‍යාපෘතියේ නම	පුහුණු කළහැකි පුද්ගලයින් සංඛ්‍යාව
01	අමුණුකුඹුර අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	10
02	අහුගම්මන අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	10
03	ගණේමුල්ල අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	05
04	මහව අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	15
05	අලව්ව අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	15
06	ඇඹරළුව අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	15
07	කිරිඇල්ල අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	15
08	වයඹ පුහුණු ආයතන ව්‍යාපෘතිය	15
09	වාරියපොළ අත්යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	15
මුළු ප්‍රතිලාභීන් ගණන		115

1.3.5. **පේෂ කර්මාන්ත විභාගය සමත් සිසුන් සඳහා සහතිකපත් ප්‍රදානෝත්සවයක් පැවැත්වීම**

2020/2021 අධ්‍යයන වර්ෂයේ අධ්‍යාපනය ලබා අවසාන සහතිකපත්‍ර විභාගය සමත් වූ සහ අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මෝස්තර නිර්මාණය පිළිබඳ උසස් පුහුණු සහතිකපත්‍ර විභාගය සමත් සිසු සිසුවියන් සඳහා 2022/10/15 දින සහතිකපත් ප්‍රදානය සිදුකරන ලදී.

1.4 සංවිධාන සටහන


අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ I)
ඒකාබද්ධ කාක්ෂණ විද්‍යාඥ - 02 (ශ්‍රී.ලං.ප.සේ I/II/III)
සහකාර අධ්‍යක්ෂ(පශුලන) - 01 (ශ්‍රී.ලං.ප.සේ II/III)
සහකාර අධ්‍යක්ෂ(සෞඛ්‍ය)-01 (ශ්‍රී.ලං.ප.සේ II/III)
අක්‍ෂණාකාර විලෝකක - 01 (ශ්‍රී.ලං.ග.සේ II/III)
ගණකාධිකාරි - 01 (ශ්‍රී.ලං.ග.සේ II/III)
පරිපාලන නිලධාරි - 01 (කා.සේ.නි- අධිශ්‍රේණි)
කාර්මික නිලධාරි -01 (ශ්‍රී.ලං.කා.සේ II/III)
සමූහාණකරණ සේවා නිලධාරි-11
වීජ ඉෂ්ඨකා - 02
සෞඛ්‍ය නිලධාරි -11
සත්ත්ව වෛද්‍ය ඇණ සංවර්ධන නිලධාරි - 01
සමූහාණකරණ සේවා නිලධාරි - 09
පරිපාලන නිලධාරි -05
සෞඛ්‍යකම්ල උපදේෂක -53
සෞඛ්‍යකම්ල උපදේෂක -08
කා.සේ.සේ - 06
කා.සේ.සේ - 03
සමීකරු -01
ශ්‍රීකරු - 03
සමීකරු -07
ශ්‍රීකරු - 15
කා.සේ.සේ - 01
සමීකරු - 01

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- ආයතන අංශය
- සංවර්ධන අංශය
- ගිණුම් අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

i. පර්යේෂණ, පුහුණු, මෝස්තර හා සේවා ආයතනය
280/1, ගාලු පාර, කටුබැද්ද, මොරටුව

ii. ස්වාභාවික වර්ණ ව්‍යාපෘතිය, රාජගිරිය

iii. පේෂ කර්මාන්ත පුහුණු ආයතන සහ මෝස්තර පුහුණු ආයතන
පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂ කර්මාන්ත පුහුණු ආයතන 14 ක් සහ මෝස්තර පුහුණු ආයතන 2 කි.

අනු අංකය	ආයතනය	ලිපිනය
01	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - කටුබැද්ද	1/280, ගාලු පාර,කටුබැද්ද,මොරටුව.
02	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - කොට්ටල	කොට්ටල,වේයන්ගොඩ.
03	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - බෝයගනේ	බෝයගනේ,කුරුණෑගල.
04	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - පින්නවල	පින්නවල,රඹුක්කන.
05	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - වටපුළුව	අරුප්පල පාර,වටපුළුව,මහනුවර.
06	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය- ගැටඹේ	ගැටඹේ,පේරාදෙණිය.
07	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය-මාතලේ	කෝන්ගහමුල,පලාපත්වල,මාතලේ.
08	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය -මාතර	හක්මන පාර,මාතර.

09	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - කිරම	කිරම.
10	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - බණ්ඩාරවෙල	කිණිගම,බණ්ඩාරවෙල.
11	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - තලාව	මිහිරිගම,තලාව.
12	අත්යන්ත්‍රපේෂ කර්මාන්ත පුහුණු ආයතනය - ගාල්ල	කලේගාන පාර,ගිංතොට,ගාල්ල.
13	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - නල්ලූර්	194,පේදුරුතුඩුව පාර,නල්ලූර්,යාපනය.
14	අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - සමන්තුරේ	සමන්තුරේ.
15	උසස් මෝස්තර පුහුණු ආයතනය - කටුබැද්ද	1/280,ගාලු පාර,කටුබැද්ද,මොරටුව.
16	උසස් මෝස්තර පුහුණු ආයතනය - ගැටඹේ	ගැටඹේ,පේරාදෙණිය.

පරිච්ඡේදය 02 : ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ආයතනයේ ප්‍රගතිය

- ❖ පේෂ කර්මාන්ත පුහුණු ආයතන සඳහා සිසුන් 150 දෙනෙකු බඳවා ගන්නා ලදී.
- ❖ සේවාස්ථ පුහුණු වැඩසටහන් 08 ක් සංවිධානය කරන ලද අතර ඒ සඳහා පුහුණුලාභීන් 195 දෙනෙකු සහභාගී වී ඇත.
- ❖ පර්යේෂණ, පුහුණු, මෝස්තර හා සේවා ආයතනයේ දී දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය සඳහා ආකල්ප සංවර්ධන වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු කරන ලදි.
- ❖ සිසුන් 207 දෙනෙකු සඳහා පේෂ කර්මාන්ත පුහුණු අවසන් සහතිකපත්‍ර විභාගය හා සිසුන් 25 දෙනෙකු සඳහා පේෂ කර්මාන්ත මෝස්තර පුහුණු විභාගය පවත්වන ලදි.
- ❖ පාසල් හැර ගිය සිසුන් සඳහා ජාතික වෘත්තිය සුදුසුකම් NVQ 4 මට්ටම දක්වා පුහුණුව ලබා දීම.
- ❖ අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පළාත් තරඟ අවසන් විනිශ්චය කටයුතු 2022-10-27 දින කටුබැද්ද පුහුණු ආයතනයේ දී පවත්වන ලදී.
- ❖ 2022 වර්ෂයට අදාළ අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත සම්මාන ප්‍රදානෝත්සවය 2022-12-02 දින කටුබැද්ද පර්යේෂණ, පුහුණු සේවා හා මෝස්තර අංශයේ ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු කරන ලදී.
- ❖ අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත අලෙවි සල්පිල බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ සිරිමාවෝ බණ්ඩාරණායක පරිශ්‍රයේ දී 2022-12-03,04 හා 05 යන දිනයන්හි පැවැත්වීමට කටයුතු කරන ලදි.
- ❖ 2021 වර්ෂයේ දී හඳුනාගත් අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ව්‍යාපෘති 10 ක මූලික පුහුණු කටයුතු 2022 වර්ෂයේ දී ආරම්භකරන ලදී. මෙම ව්‍යාපෘතිවල 71 දෙනෙකු පුහුණුව ලබයි.
- ❖ 2022 වර්ෂයේ දී පේෂකර්ම උපදේශක නිලධරයන් 60 දෙනෙකු හට RPL ක්‍රමය යටතේ NVQ 4 මට්ටම ලබා දීමට කටයුතු කර ඇත.
- ❖ 1980-1982 ආරම්භ කළ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව සතුව පැවති බලවේග ව්‍යාපාර 10ක වසර 10 අඩු සේවා කාලයක් ඇති යන්ත්‍ර සේවකයන් 4166 දෙනෙකුගෙන් 80% ක් ජීවත්ව සිටින බව සලකා 3332 කට ඔවුන් ජීවත්ව සිටින තෙක් මාසික දීමනා ගෙවීමේ කටයුතු 2022 වර්ෂයේ අප්‍රේල් මස සිට ගෙවීමේ කටයුතු විමධ්‍යගත කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර ඇත.
- ❖ ITMIS පද්ධතිය හරහා දෛනික ගෙවීම් කටයුතු මාර්ගගතව යාවත්කාලීන කිරීම හා ගෙවීම් කටයුතු සාර්ථකව සිදුකිරීම.
- ❖ නවක ව්‍යවසායකයින් සහ විශ්ව විද්‍යාල සිසුන් සඳහා අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සම්බන්ධයෙන් මර්ගෝපදේශ හා උපදේශන සේවා ලබාදීම.
- ❖ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව සතුව තිබූ බලවේග පේෂකර්ම ඉඩම් 11 න් 09ක්ම භුක්තිය සඳහා 2022 වර්ෂය අවසාන වන විට ආදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ට ලබා දී අවසන් කර ඇත.

2.2 ආයතනයේ ඉදිරි දැක්ම

- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදන ගම්මාන 10 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ආශ්‍රිත පුහුණු පාඨමාලා 30 ක් පැවැත්වීමට සැලසුම් කිරීම.
- පේෂ කර්මාන්ත ප්‍රදර්ශන අළෙවි සල්පිළ හා සම්මාන ප්‍රදානෝත්සවයට සමගාමීව පවත්වනු ලබන පළාත් අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත තරඟය හා ජාතික තරඟය පැවැත්වීම.
- පේෂ පාසල් අවසන් සහතික පත්‍ර විභාගය හා මෝස්තර පුහුණු විභාගය පැවැත්වීමට නියමිතය.
- දෙපාර්තමේන්තුව සතුව ඇති අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත පාසල් 14 න් 04 ක් වඩාත් ආකර්ෂණීය ලෙස නවීකරණය කිරීම
- වර්ෂ 1980 -82 කාලය තුළ මෙම දෙපාර්තමේන්තුවට අයත් බලවේග ව්‍යාපාර 10 ක් පුද්ගලික අංශයට පැවරීමේ දී වසර 10ට අඩු සේවා කාලයක් ඇති යන්ත්‍ර ක්‍රියාකරුවන්ට ජීවත්ව සිටින තෙක් මාසික දීමනාවක් ගෙවීමට යන්ත්‍ර ක්‍රියාකරුවන්ගෙන් 80% ක සංඛ්‍යාවක් පමණක් එනම්, 3332 දෙනෙකු සඳහා ගෙවීම් කටයුතු වඩා විධිමත් හා කඩිනම් කිරීමේ අරමුණින් විමධ්‍යගත කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවීම් මේ වන විට සිදුකරමින් පවතී. එමෙන්ම 2023 වර්ෂයේ දී මාසික දීමනා නොගෙවන ලද ඉතිරි යන්ත්‍ර ක්‍රියාකරුවන් 20% න් ජීවත්ව සිටින සියලුමදෙනා හට මාසික දීමනා ගෙවීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිතයි.
- දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩලයේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම සඳහා ධාරිතා ප්‍රවර්ධන පුහුණු වැඩමුළු පැවැත්වීම
- පාසල් 14 හා මෝස්තර පුහුණු පාසල් 2 හි සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩමුළු පැවත්වීම.

2.3 අභියෝග

- ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම
- ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම
- ප්‍රමාණවත් ඉඩ හා පහසුකම් සහිත සේවා ස්ථානයක් නොමැති වීම
- අභ්‍යන්තර විගණන තනතුර සහ තාක්ෂණ නිලධාරී තනතුරෙහි පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම.
- දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ කටයුතු සඳහා තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරක් අනුමත කර ගැනීම.
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිල දිනෙන් දින ඉහළයාම.
- අත්යන්ත්‍ර නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් වෙළඳපොළ අවස්ථා නොමැති වීම.
- අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන වලට අගය එකතු කිරීමක් සිදුනොවීම සහ විදේශ වෙළඳපොළ ඉලක්ක කර නොගැනීම.

2.4 ආයතන ප්‍රධානියාගේ අත්සන



නම : යූ.වී.එස්. සේනානි සෙනෙවිරත්න

තනතුර: අධ්‍යක්ෂ

පරිච්ඡේදය 03 :සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය රු.ශත		**ඉකුත් වර්ෂය රු.ශත**
-	**ආදායම් ලැබීම්**		-		-
-	ආදායම් බදු	1	-		-
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-		-
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-		-
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-		-
-	**මුළු ආදායම් ලැබීම්(අ)**		-		-
-	**ආදායම් නොවන ලැබීම්**		-		-
-	භාණ්ඩාගාර අග්‍රිම		198,740,000		314,315,000
-	තැන්පතු		1,542,569		4,112,082
-	අත්තිකාරම් ගිණුම්		5,552,804		4,701,338
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		-
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**205,835,373**		**323,128,420**
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)**		**205,835,373**		**323,128,420**
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)**		-		-
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) – (ඈ)**		**205,835,373**		**323,128,420**
-	**අඩු කළා : වියදම**		-		-
-	**පුනරාවර්තන වියදම්**		-		-

77,500,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	74,754,339		66,354,042
21,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	18,973,472		21,345,463
215,500,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	215,696,318		185,267,721
-	පොළී ගෙවීම්	8	-		-
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-		-
314,500,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**309,424,129**		**272,967,226**
	මූලධන වියදම්				
800,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	1,015,963		5,129,878
200,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	105,800		39,500
-	ප්‍රාග්ධන මාරු කිරීම	12	-		-
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-		-
-	හැකියා වර්ධනය	14			44,387,641
30,000,000	වෙනත් මූලධන වියදම්	15	29,958,071		-
31,000,000	**මුළු මූලධන වියදම (උ)**		**301,079,834**		**49,557,019**
	තැන්පතු ගෙවීම		5,016,846		1,856,625
	අත්තිකාරම් ගෙවීම		5,258,228		7,196,196
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම		-		-
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		10,275,074		9,052,821
	මුළු වියදම එ = (ඊ +උ +ඌ)		**350,779,037**		**331,577,066**
345,500,000	**දෙසැම්බර් 31 දිනට අඟ්‍රිම ශේෂය ඒ = (ඉ-එ)**		**(144,943,664)**		**(8,448,646)**
	අඟ්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(144,943,664)**		**(8,448,646)**
	දෙසැම්බර් 31 දිනට අඟ්‍රිම ශේෂය		**(144,943,664)**		**(8,448,646)**

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්සා 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	268,815,527	268,709,727
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	19,200,608	19,495,184
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**288,016,135**	**288,204,911**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		19,081,908	15,902,208
දේපළ පිරියත හා උපකරණ සංචිතය		268,815,527	268,709,727
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	118,700	3,592,976
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**288,016,135**	**288,204,911**

පිටු අංක 07 සිට 27 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 28 සිට 35 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විශ්කර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 28/02/2023	දිනය : 28/02/2023	දිනය : 27/02/2023
ජේ.එම්. තිලකා ජයසුන්දර ලේකම් කර්මාන්ත අමාත්‍යාංශය 73/1, නාලු පාර, කොළඹ 03.	ඩී. ආර්. මාමුහේවා අධ්‍යක්ෂ (වැ.ඛ.) පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව 3 වන මහල මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, මාලිගාවත්ත, කොළඹ 10.	එච්. පී. නන්දනී ගණකාධිකාරි පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව 3 වන මහල, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, මාලිගාවත්ත.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය	**ඉකුත් වර්ෂය**
	රු.ශත	**රු.ශත**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	5,020,551	9,207,719
අග්‍රිම ලැබීම්	198,740,000	314,315,000
අත්තිකාරම් අයකර ගැනීම	5,552,804	5,278,841
තැම්පතු ලැබීම්	1,542,569	4,112,082
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**210,855,924**	**332,913,642**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	93,727,811	87,654,005
සහනාධාර සහ මාරු කිරීම්	215,696,318	185,267,721
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	7,963,935	1,375,826
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	5,258,228	7,196,196
තැන්පතු ගෙවීම	5,016,846	1,856,625
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**327,663,156**	**283,350,373**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**116,807,232**	**49,557,019**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-

ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
අත්තිකාරම් අයකර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)		-
<u>අඩු කළා - මුදල් වැය කිරීම්;</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	**31,079,834**	**49,557,019**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**31,079,834**	**49,557,019**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(31,079,834)**	**(49,557,019)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	**(147,887,066)**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩු කළා - මුදල් වැය කිරීම්;</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ)	(147,887,066)	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇතිවිට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	**අවසන් ඇස්තමේන්තුව**	**ප්‍රමාණය** (රු.)	**අවසාන ආදායම් ඇස්තමේන්තුවේ** % **ලෙස**
2002.01.00 2002.01.01	**කුලී** රජයේ ගොඩනැගිලි කුලී	-	-	870,757.43	
2002.02.00 2002.02.99	**පොළිය** වෙනත්			701,965.39	
2003.99.00	**අනෙකුත් ලැබීම්**	-	-	2,354,608.75	
2004.01.00 2004.01.00	**සමාජ සංරක්ෂණ දායක මුදල්** මධ්‍යම රජය	-	-	3,057,547,11	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	**අවසාන ප්‍රතිපාදනය**		
පුනරාවර්තන	314,500,000	314,500,000	309,424,129	98.5%
ප්‍රාග්ධන	31,250,950	31,250,950	31,079,834	99.5%

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන රු.	අවසාන ප්‍රතිපාදන රු.		
130	පළාත් සහ පළාත් පාලන අමාත්‍යාංශය	ආර්ථික සංවර්ධන නිලධාරීන් සඳහා ගෙවීම් කිරීම	1,372.992.86	1,372,992.86	1,372.992.86	100%
149	කර්මාන්ත අමාත්‍යාංශය	ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය - NVQ සහතික ලබා ගැනීම	5,360,000.00	5,360,000.00	5,322,748.40	99%
253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	අත්තිකාරම් ණය පියවීම	1,268,212.00	1,268,212.00	1,268,212.00	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	127,979,125.00	127,979,125.00	-	100%
9152	යන්ත්‍රෝපකරණ	41,277,552.00	41,277,552.00	-	100%
9153	ඉඩම්	99,561,850.00	99,561,850.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීජඩි/ඒ/ඩීවීඅයි/එෆ්එස්/22/25 මෙම අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 30 දින

අධ්‍යක්ෂ,

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තව

ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ කවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනු ලබන විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම රු.1,740,746 ක් අඩුවෙන්ද, අත්තිකාරම් අය කර ගැනීම් රු.109,670 ක් වැඩියෙන්ද දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.1,631,076 කින් ඌන ගණනය වී තිබුණි.

1.6.2 පුනරාවර්තන වියදම්

පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වෙනුවෙන් මු.රෙ.208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් දැරූ රු.242,430 ක් ද, සහනාධාර සහ මාරුකිරීම් යටතේ, මු.රෙ.208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් දැරූ රු.143,679,980 ක් ද, වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.357,650 ක් වැඩියෙන්ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රවාහය රු.144,280,060 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.3 මූලධන වියදම්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හෝ වෙනත් ආයෝජන අත්කර ගැනීම් තුළ මු.රෙ.208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් දැරූ රු 1,975,930 ක්ද ඇතුළත් වී තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුළු මුදල් ප්‍රවාහය රු.1,975,930 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.4 මූල්‍ය නොවන වත්කම්

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදය අනුව තවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් පවතිනම් ඒවා හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි විට තක්සේරු අගයට හෝ වාර්තා කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු පේෂ පාසැල් 09 ක, පෙහෙකම්හල් 08 ක හා සංචාරක නිවාස 02 ක් සහිත ඉඩම්වල හා වාහනයක වටිනාකම් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම් ගත කර නොතිබුණි.

1.6.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

දෙපාර්තමේන්තුව සතු ලෙස දක්වා තිබූ පේෂකර්මාන්ත පුහුණු ආයතන 14 ක සහ සංචාරක නිවාස දෙකක අයිතිය තහවුරු කර ගැනීමට නීත්‍යානුකූල සහතික ඉදිරිපත් කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **ආදායම් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තලල්ලේ බලවේග පේෂ කර්මාන්ත ඉඩම හා ගොඩනැගිල්ල 2010 වර්ෂයේ සිට වසර 30 ක් පුද්ගලික සමාගමකට බදු දී තිබියදී 2016 වසරේ සිට බදු ගෙවීම පැහැර හැර තිබුණි. 2016 සිට 2019 දක්වා වූ රු.8,910,000 ක හිඟ බදු ශේෂය, 2022 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. එම ගොඩනැගිල්ල සහිත ඉඩම බදුකරු භුක්ති විඳිමින් සිටිය ද විගණිත දින දක්වාත් රජයට භාරදී නොතිබුණි.

(ආ) යටිනුවර බලවේග පේෂකර්මාන්ත ආයතනය, පෞද්ගලික ආයතනයක් වෙත 2000 වසරේ සිට වසර 30 කට බදු දී තිබුණි. අනවසර පදිංචිකාරියක් එම පරිශ්‍රයේ රැඳී සිටීම හේතුවෙන් බදු දේපළෙහි නිරවුල් අයිතිය ලබානොදීම මත 2000 වසරේ සිට 2012 වසර දක්වා ගෙවිය යුතු බදු මුදල් රු.2,756,000 ක් ගෙවීම බදුකරු විසින් පැහැර හැර තිබුණි. එම මුදල් අයකර ගැනීමට සහ අනවසර පදිංචිය ඉවත්කර ඉඩමෙහි නිරවුල් භුක්තිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීමට විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 1996 වර්ෂයේ සිට වසර 30 ක් සඳහා බිබිල නිම්හල ආයතනය පුද්ගලික සමාගමක කළමනාකරණ අධ්‍යක්ෂකවරයෙකුට බදු දී තිබුණි.එම සමාගමෙන් අයවිය යුතු හිඟ බදු මුදලට අදාලව 2022 සැප්තැම්බර් 27 දිනැති අවසාන බෙරුම්කරණ තීන්දුව ප්‍රකාරව රු.1,681,250 ක් හා පොළිය ගෙවීමට නියෝග කර ඇතත්, බදුකරු ගෙවීම් පැහැර හැර තිබුණි.

2.2 **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ග්‍රාමීය මට්ටමින් ව්‍යාප්ත කර ග්‍රාමීය ව්‍යවසායකයින් බිහිකිරීමේ අරමුණ මත ක්‍රියාත්මක අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ගම්මාන ව්‍යාපෘතිය වෙනුවෙන් 2021හා 2022 වර්ෂවල මිලදීගත් අත්යන්ත්‍ර ආශ්‍රිත උපකරණවලින් වටිනාකම රු.23,960,750 ක් වූ අත්යන්ත්‍ර කට්ටල 220 ක් සහ වයින්ඩින් යන්ත්‍ර කට්ටල 195 ක් වාර්තාවේ දින වන විටත් නිශ්කාර්යව පැවතුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

සමාලෝචිත වර්ෂයේ පේෂකර්ම පුහුණු ආයතන 14 ක පරිපාලනය වෙනුවෙන් රු.මි.3.835 ක් වැය කර තිබුණද අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට ශ්‍රමිකයින් පුහුණු කිරීම සම්බන්ධයෙන් පැවැත් වූ පාඨමාලා වල ප්‍රගතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ සය මාසික පාඨමාලාව 2021 හා 2022 වර්ෂයේ දී මාතර හා කටුබැද්ද පේෂකර්ම පුහුණු ආයතන දෙකෙහි පමණක් පවත්වා තිබූ අතර පිළිවෙලින් සිසුන් 2නෙකු හා 04 දෙනෙකු පමණක් පාඨමාලාව අවසන් කර තිබුණි.

(ii) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ සිසුන් පිළිවෙලින් 147 ක් හා 87 ක් අවසන් සහතික පත්‍ර පාඨමාලාව අවසන් කර ඇතත්, පාඨමාලා සඳහා සිසුන්ගේ සහභාගීත්වය ඉකුත් වර්ෂයට වඩා සියයට 40 කින් අඩු වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ පේෂකර්ම පුහුණු ආයතන 4 ක පාඨමාලාව අවසන් කළ සිසුන් ගණන 1,2,3,හා 4 ක් දක්වා අඩු මට්ටමක විය.

(iv) සිසුන් 119 කට නේවාසික පහසුකම් සැපයිය හැකි පේෂකර්ම පුහුණු ආයතන 13 කින් සමාලෝචිත වර්ෂයේදී සිසුන් 58 ක් නේවාසිකාගාර පහසුකම් ලබාගෙන තිබුණි. ඒ අනුව සැපයිය හැකි නේවාසිකාගාර පහසුකම්වලින් සියයට 52 ක් උපයෝජනය වී නොතිබුණි.

(v) වැය කළ මුදලට සාපේක්ෂව ප්‍රමාණවත් පුහුණු සිසුන් බිහි නොවීම කළමනාකරණයේ අවධානයට ලක්විය යුතු කරුණක් බව නිරීක්ෂණය විය.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයිතිය නිශ්චිතව හඳුනාගෙන නොමැති, මුරකුටියක් හා ගොඩනැඟිලි 02 ක් සහිත රාජගිරියේ පිහිටි ස්වාභාවික වර්ණ ගැන්වීම් මධ්‍යස්ථානය පර්චස් 30කින් යුක්ත ඉඩමක් වූ අතර වසර 2කට වැඩි කලක සිට උපයෝජනය නොවී පැවතුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දින භෞතිකව පවතින නූල් තොගයෙහි ප්‍රමාණය 6,798 Kg ක් වූ අතර පේෂ පාසැල් සඳහා පවත්වාගත යුතු නූල් තොග අවශ්‍යතාවය ඉක්මවා පැවතිබව නිරීක්ෂණය වූ අතර එම අතිරික්ත තොග ඵලදායී ලෙස යොදාගැනීමට වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත වී ඇතත් පුරප්පාඩු සම්පූර්ණ වී නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටුව

සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබූ අතර එක් අමාත්‍යාංශ කමිටු රැස්වීමක් පවත්වා තිබුණි.

ඒ. ඒ. ඩී.නිරංජා
ඒ.ඒ.අයි.නිරංජා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04 : කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
	100% - 90%	75% -89%	50% - 74%
1) පේෂකර්ම පුහුණු ආයතන පරිපාලනය - සිසුන් 150 දෙනෙකු පුහුණු කිරීම සඳහා බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කිරීම	√		
2) පළාත් ප්‍රදර්ශන තරග පැවැත්වීම,අවසන් තරඟ විනිශ්චය කටයුතු සිදුකිරීම	√		
3) සේවාස්ථ පුහුණු 08ක් පැවැත්වීම			√
4) මෝස්තර පුහුණු පාඨමාලා විභාගය ජූලි මස පැවැත්වීම, පේෂ කර්මාන්ත අවසාන සහතික පත්‍ර පාඨමාලාවේ විභාගය මාර්තු මස පැවැත්වීම	√		

පරිච්ඡේදය 05 : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

ඉලක්ක/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50%-74%	75% - 100%
4.4 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහල නැංවීම	2030 වසර වන විට අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තිකයින් 5000ක් සඳහා NVQ මට්ටම් 4 ලබා දීම	2025 වසර වන විට වෘත්තිකයින් 2500ක් සඳහා NVQ ලබා දීම	√		
9.2 සියලුදෙනාම අන්තර්ගත වන්නා වූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්ත්වයන්ට අනුකූල රැකියා වන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහල නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම	අත්‍යන්ත්‍ර ක්ෂේත්‍රයේ දායකත්වය ඉහල නැංවීම තුලින් කර්මාන්ත අංශයෙන් දළ ජාතික නිෂ්පාදනයට දක්වන දායකත්වය 2030 වසර වන විට 10%ක් බවට පත් කිරීම	2025 වසර වන විට දළ ජාතික නිෂ්පාදනයට දක්වන දායකත්වය ඉහල නැංවීම	√		

පරිච්ඡේදය 06 :මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	07	05	02
තෘතියික	01	01	0
ද්විතියික	95	87	08
ප්‍රාථමික	42	30	12

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය

- අභ්‍යන්තර විගණක තනතුරයෙහි සහ තාක්ෂණ නිලධාරී තනතුරයෙහි පවතින පුරප්පාඩු නිසා රාජකාරී කටයුතු වල දී දුෂ්කරතා මතු කරයි.
- තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරක් හෝ තොරතුරු තාක්ෂණ සහකාර තනතුරක් දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලයෙහි ඇතුළත් නොවන බැවින් තොරතුරු තාක්ෂණ කටයුතු සිදුකර ගැනීමේ දී මහත් අපහසුතාවයක්ට ලක්වීමට සිදුව ඇත.
- කළමනාකරණ සේවා නිළධාරි තනතුරු පුරප්පාඩු නිසා ගිණුම්, පාලන හා සංවර්ධන අංශ 03 ම කටයුතු ඉටු කිරීමේදී දුෂ්කරතා මතු කරයි.

පරිච්ඡේදය 07 :අනුකූලතා වාර්තාව

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිළි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම** (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල්ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය** (මු.රෙ.135)			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම.	අනුකූල වේ		

4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා පුරප්පාඩුවක් ඇත	පුරප්පාඩුව පිරවීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා පුරප්පාඩුවක් ඇත	පුරප්පාඩුව පිරවීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිලිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා පුරප්පාඩුවක් ඇත	පුරප්පාඩුව පිරවීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත

6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරන කමිටු 4ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා පුරප්පාඩුවක් ඇත	පුරප්පාඩුව පිරවීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		

8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල නොවේ	රක්ෂණය මඟින් අලාභය පුනිපූර්ණය කරවා ගැනීම	හිමිකම් නොපෑමේ දීමනාව අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීම
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	විශ්‍රාම යාම හා ස්ථාන මාරු වීම් සිදුවීම	1.දෙපාර්තමේන්තුමය බඳවා ගැනීම් කඩිනම් කර ඇත. 2.ඒකාබද්ධ/දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් පුරප්පාඩු සම්බන්ධයෙන් දැනුවත් කර ඇත
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව භාරදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			

17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කොට තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමිණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	මෙතෙක් සම්පාදනය කිරීමට පියවර ගෙන නොමැත	ඉදිරියේදී සම්පාදනය කිරීමට පියවර ගැනීම
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	මෙතෙක් සම්පාදනය කිරීමට පියවර ගෙන නොමැත	ඉදිරියේදී සම්පාදනය කිරීමට පියවර ගැනීම
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		